නිවන් දැකීමට උපකාර වන්නේ පරම පවිත්‍ර සිරි සද්ධර්මයයි



# සංසාර ණය ගනුදෙනු වලින් මිදී නිදහස් වෙන්නට උපකාර වන්නා වූ කරුණු හතරක්


දේශකයාණන් වහන්සේ

පරම සත්‍යය පෙන්වා දුන් බුද්ධ පුත්‍ර අතිගෞරවණීය

මීවනපලානේ සිරි ධම්මාලංකාර ස්වාමීන්වහන්සේ

# අද නිවන් දැකිය නොහැකිද?

# නිවන් මග වැසුනේ කෙසේද?

දීර්ඝ කාලයක් තිස්සේ වැසී යටපත්ව පැවති, ප්‍රායෝගික නිවන් මග යළි නිරාවරණය කරමින් නිබ්බාන වීම සඳහාම උපකාරී වන, පෙර නොඇසූ විරූ, මෑත කාලය වන තුරුම භාවිතයට ගත නොහැකිවන සේම යටපත්ව පැවති "පරම පවිත්‍ර නිර්මල සිරි සද්ධර්මය" අත්ථපටිසම්භිදා, ධම්මපටිසම්භිදා, නිරුක්තිපටිසම්භිදා, පටිභානපටිසම්භිදා යන සිව්පිලිසිඹියාපත් විග්‍රහයන් සහිතව දේශනා කරනු ලබන බුද්ධ භාෂිතයේ සමස්ත ධර්මස්කන්ධයම දරා සිටින, "සං" දේශනාව නැවත මතුකර ලෝකයාට දේශනා කළ අතිපූජ්‍ය මීවනපලානේ සිරි ධම්මාලංකාර බුද්ධ පුත්‍රයාණන් වහන්සේ විසින් හෙළබිමෙහි විවිධ ස්ථාන වලදී පවත්වනු ලබන පරම පවිත්‍ර සිරි සද්ධර්ම දේශනා ශ්‍රවණයකර අතිදුර්ලභව ලැබූ මේ මිනිසත් බවෙහි අරුත වටහා ගැනීමටත් බියකරු වූ සංසාර දුකින් සදහටම මිදී නිදහස් වීමටත්, කැමති සුපින්වත් ඔබ සැමට ආරාධනා!

- සංදේශනාව විග්‍රහකර පිරිසිදුව දේශනා කළෙමි.

- පටිච්ච සමුප්පාද ධර්මය විග්‍රහ කළෙමි.

- ද්වතාවය සහ ද්වතානුස්සතිය පැහැදිලිකර විග්‍රහ කළෙමි.

- තිපරිවට්ටය සම්පූර්ණ වශයෙන් පැහැදිලිකර, නිවන් දැක ගන්නටම උපකාරවන ලෙසින් දේශනා කළෙමි.

- මේ අනුව සීල, සමාධි, පඤ්ඤා යන ත්‍රිසික්ඛා සම්පූර්ණ කරගෙන, චතු අරිය සත්‍යයන් යථාවබෝධයෙන් යුතුව දැකගන්නටත්, මගඵල ලබා සංසාර ගමනේ දුක සහමුලින්ම නිමා කරගන්නටත්, උපකාර වනසේ මෙතෙක් වැසී යටපත්ව අභාවයට ගොස් තිබූ පරියාප්ති ශාසනය යළි මතුකර දේශනා කළ බව සීහනාද පතුරා ලෝකයාට ප්‍රකාශකර සිටිමි.

අතිගෞරවණීය මීවනපලානේ සිරි ධම්මාලංකාර

බුද්ධ පුත්‍රයාණන් වහන්සේ

# සංසාර ණය ගනුදෙනු වලින් මිදී නිදහස් වෙන්නට උපකාර වන්නා වූ කරුණු හතර

❖ ධම්මානුධම්ම පටිපදාවේ හැසිරෙන සීලයේ පිහිටා භාවනානුයෝගීව සිටින මග ඵල ලැබූ නොලැබූ සෑම කෙනෙකුටම සංසාර ණය ගනුදෙනු වලින් මිදී නිදහස් වෙන්නට උපකාර වන්නා වූ මූලික කරුණු හතරක් සම්පූර්ණ කරගත යුතුව තිබෙනවා.

❖ මේ කරුණු හතර සෑම කෙනෙක්ම අදම පටන්ගෙන ජීවත්වන කාලය තුළ මරණ මොහොත දක්වාම හැකි සෑම අවස්ථාවකම, අවම වශයෙන් දිනපතා උදේ සහ සවසවත් කළයුතු දේවල් බව (කහ පාටින් ඇති කොටස්) බොහොම අවධාරණයෙන් කියනවා.

❖ මිනිසත් බව ලැබූ හැම කෙනෙක්ම හැකි සෑම විටම රාග, ද්වේශ, මෝහ ප්‍රහාණය කරමින් කුසල් පිරීමට ඇප කැපවී කටයුතු කිරීමට (කුසලස්ස උපසම්පදා) කල්පනා කළ යුතුයි. රාග, ද්වේශ, මෝහ නිසා තම තමන් විසින් එකතු කරගන්නා, චිත්තය කිළිටි කරන සියලු කෙළෙස් ගති සලා හැර ප්‍රහාණයකර චිත්ත පාරිශුද්ධියට පත් කරගැනීම කුසල් පිරීමයි. උදාහරණයක් ලෙස දන්දීම්, බෝධි පූජා ආදී පින්කමක් කර තමන්ට දෙව් මිනිස් සැප ප්‍රාර්ථනා කිරීමෙන් එය පිනක් මෙන්ම අකුසලයක් (කෙළෙස් අත් නොහැර භාවිතා කරන නිසා) බවට පත්වේ. එනම් කුසල් පිරීමක් සිදු නොවේ. අපි තුන් හිත පහදා ගෙන එනම් රාගයෙන්, ද්වේශයෙන්, මෝහයෙන් තොරවූ පිරිසිදු සිතක් සුළු මොහොතකට හෝ පවත්වාගෙන ඒ පින්කමින් ලබාගත් සියලු පින් සංසාර ණය ගනුදෙනු වලින් මිදී නිදහස් වීම සඳහා සියලු සත්වයන්ට අනුමෝදන් කිරීමෙන් එය කුසලයක් බවට පත්වෙනවා. මේ ආකාරයට ඉදිරියේදී විස්තර කරනු ලබන කරුණු හතර සෑම කෙනෙකුටම කුසල් පිරීමට මෙන්ම නිවන් දැකගැනීමට මහෝපකාරී වෙනවා.

# පළමු කරුණ - කමාව ගැනීම

❖ මේ සංසාර ගමනේ අනන්ත අප්‍රමාණ කාලයක් අපි මේ තල තිස් එකේ නොයෙකුත් තැන්වල ඉපදිලා තියෙනවා. ඒ ඉපදිලා තියෙන තැන්වල දී අප විසින් ක්‍රියාවෙන්, වචනයෙන්, සිතින් නොයෙකුත් අයට දැන හෝ නොදැන හිංගි, හිංසා, අවැඩ, අසාධාරණ, අපවාද, අවලාද, අපහාස, පාප ක්‍රියා ආදී වැරදි වැඩ කරලා තියෙනවා. ඒ නිසාවෙන් අපි ඒ අය සමග සංසාර ගමන දිගු වීමට හේතුවන ණය ගනුදෙනු ඇති කරගෙන තියෙනවා. දැන් ඒවාට පසුතැවිලා, වික්ෂෝප වෙලා වැඩක් නෑ. හැබයි ඒවාට කළහැකි ප්‍රතිකර්ම, උපකර්ම, උපක්‍රම, සම්මප්‍රයෝග තියෙනවා. ඒවා අනිවාර්යයෙන්ම කළ යුතුයි. එසේ කිරීමෙන් සංසාර ගමන දිගු වීමට හේතුවන ණය ගනුදෙනු වලින් මිදී නිදහස් වෙන්න පුළුවන්. මොකක්ද මේ ප්‍රතිකර්ම, උපකර්ම, උපක්‍රම සහ සම්මප්‍රයෝග?

❖ අපි දැන හෝ නොදැන කරලා තියෙන වැරදි වලට ජීවත් වෙලා ඉන්න අයගෙන් අභිමුඛවත් අභිමුඛව කරන්න බැරි දැනට සුජීවත්ව නැති අයගෙන්, අනභිමුඛවත් සමාව ගත යුතුයි.

- පළමුව බුද්ධ, ධම්ම, සංඝ යන රත්නත්‍රයෙන් සමාව ගැනීම සඳහා පහත ගාථාව යථාවබෝධයෙන් යුතුව කියන්න.

කායේන වාචා චිත්තේන පමාදේන මයා කථං
අච්චයන් ඛම මේ භන්තේ භූරි පඤ්ඤ තථාගත

කායේන වාචා චිත්තේන පමාදේන මයා කථං
අච්චයන් ඛම මේ ධම්ම සංදිට්ඨික අකාලික

කායේන වාචා චිත්තේන පමාදේන මයා කථං
අච්චයන් ඛම මේ සංඝ සුපටිපන්න අනුත්තර

- අනන්ත සංසාරයේ පටන් මේ මොහොත දක්වා මගේ අතින් දැන හෝ නොදැන ක්‍රියාවෙන් වචනයෙන් සිතින් (කායේන වාචා චිත්තේන) තුනෙන්ම ලොව්තුරා බුද්ධ, පසේ බුද්ධ, අරහත් බුද්ධ ආදී අරිය උත්තමයන් වහන්සේලා කෙරෙහි, විශේෂයෙන්ම බුදුහාමුදුරුවෝ දේශනා කළ පරම පවිත්‍ර සිරි සද්ධර්මය කෙරෙහි, අරිය මග යන උත්තමයන් වහන්සේලා කෙරෙහි යම් හිංගි, හිංසා, අවැඩ, අසාධාරණ, අපවාද, අවලාද, අපහාස ආදී පාප ක්‍රියා සිදුකරගෙන ඇත්නම් අරිය උපවාද සිදුකරගෙන ඇත්නම් බුද්ධ ධම්ම සංඝ යන රත්නත්‍රයද, සියලු අරිය උත්තමයන් වහන්සේලාද මට කමා කරන සේක්වා! මට කමා කරන සේක්වා! මට කමා කරන සේක්වා! මට කමා කරත්වා! මට කමා කරත්වා! මට කමා කරත්වා!.

- අනන්ත සංසාරයේ පටන් මේ මොහොත දක්වා මගේ අතින් දැන හෝ නොදැන ක්‍රියාවෙන් වචනයෙන් සිතින් තුනෙන්ම ස්වාමීන්වහන්සේලා ඇතුලු සම්මත පූජ්‍ය පක්ෂයට, අනන්ත සංසාරයේ පටන් මේ මොහොත දක්වා මා පැමිණි මේ සංසාර ගමනේ දී මට දෙමව්පියන් වූ, වැඩිහිටියන් වූ, ගුරුවරු වූ, සහෝදර සහෝදරියන් වූ, ස්වාමිපුරුෂයන් වූ, භාර්යාවන් වූ, දූදරුවන් වූ, ඥාති හිත මිත්‍රාදීන් වූ, සේව්‍ය සේවකයන් වූ, අසල්වැසියන් වූ සියලු දෙනාටම, සියලු ලෝක සියලු සත්වයන්ට, ආපෝ තේජෝ වායෝ පඨවි සතර මහා ධාතු භූත ශක්තියෙන් යුත් ස්වභාවධර්මයට, ගහ කොළ වලට යම් හිංගි, හිංසා, අවැඩ, අසාධාරණ, අපවාද, අවලාද, අපහාස ආදී පාප ක්‍රියා සිදුවූවා නම් ඒ හැමදේටම මට කමාව ලැබේවා! මට කමාව ලැබේවා! මට කමාව ලැබේවා! මට කමා කරත්වා! මට කමා කරත්වා! මට කමා කරත්වා!

❖ මේ ආකාරයට අප විසින් අද අදම කරපු අරිය උපවාද, අවැඩ, අසාධාරණකම් වලින් පාප ක්‍රියා වලින් අපි අද අදම මිදී නිදහස් විය යුතුයි. එදිනම හවස නින්දට යාමට පෙර මේ සමාව ගත යුතුයි. එතකොට අපි කරපු වැරදි වලින් අපේ හිතේ තියෙන ද්වේශයෙන්, වෛරයෙන්, ක්‍රෝධයෙන් කොටසක් ප්‍රහාණය වෙලා කැඩිලා ඉවත් වෙලා යනවා. ඒ අනුව තමන් විසින් අතීත සංසාර ගමනේ දී දැන හෝ නොදැන කළ බොහෝ වැරදි වලින් තමන්ටම මිදී නිදහස් වෙන්න පුළුවන්. එසේම එවැනි වැරදි නැවත නොකිරීමට තම සිත තුල තිර අධිෂ්ඨානයක් ඇතිකරගත යුතුයි. මේ සංසාර ගමනේ දී ඇති කරගත් වැරදි ආකාර වූ සම්බන්ධතා වලින් සංසාර ගමන දිගු කරන ණය ගනුදෙනු වලින් මිදී නිදහස් වෙන්න මේ “පළමු පියවර” මහෝපකාරී වෙනවා.

## දෙවෙනි කරුණ - අරිය මෛත්‍රිය පැතිරවීම

❖ අනන්ත සංසාරයේ පටන් මේ මොහොත දක්වා අප විසින් තරහෙන්, වෛරයෙන්, ක්‍රෝධයෙන්, පටිඝයෙන්, පුද්ගලයන්ට සත්වයන්ට ස්වභාවධර්මයට ක්‍රියාවෙන්, වචනයෙන්, සිතින් වැරදි දේ කරමින් අවැඩ අසාධාරණකම කරමින් විශ්වයට කළු කිරණ (විෂ කිරණ) නිකුත්කර ස්වභාවධර්මය කිළිටි කරන්නට ඇති. ඒ වෙනුවට දැන් ඒ සියලු දෙනාටම අරිය මෛත්‍රිය (පරම මෛත්‍රිය) පතුරවා අපේ හිත පිරිසිදු කරගෙන විශ්වයට පිරිසිදු සුදු චිත්ත කිරණ ශක්තියක් පැතිරවිය යුතුයි. එසේ කිරීමෙන් අප විසින් කිළිටි කළ විශ්වය නැවතත් පිරිසිදුකර ණයෙන් මිදී නිදහස් වන්නට හැකියාව ලැබෙනවා.

❖ අපේ හිතේ යම් ද්වේශයක්, වෛරයක්, ක්‍රෝධයක් තිබුණා නම්, තවදුරටත් පවතිනවා නම් ඒ හිත පිරිසිදු කරගැනීමට අරිය මෛත්‍රිය පැතිරවීම උපකාර වෙනවා. තමන්ගේ හිතේ උපන් වෛරය නැති

කරගන්න, අරිය මෛත්‍රී භාවනාව කරලා (මෙත්තානුස්සති) තම චිත්ත සංතානය තුළ නිච්ච වූ, සුඛ වූ, අත්ථ වූ වෛරය අනිච්ච, දුක්ඛ, අනත්ථ බව මෙනෙහි කරලා, මේ වෛරයෙන් තමන් සදහටම මිදී නිදහස් විය යුතුයි. තමන්ගේ හිත පරම මෙත් සිතක් කරගත යුතුයි.

❖ මම, මගේ, මට ආදී ලෙස නිච්ච, සුඛ, අත්ථ සංඥාවකින් (සංඥාවේ නිච්ච, සුඛ, අත්ථ බව) යුතුව මෛත්‍රී භාවනාව කරන එක අත්හැරිය යුතුයි. මම නිදුක් වෙම්වා! මගේ අම්මා තාත්තා නිදුක් වෙත්වා! යනාදීන් පරම මෛත්‍රීයට අයිති නැහැ. ඒවා බොහොම වැරදි අස්මිමානය, ආත්ම වාදය මතු කරන වැරදි මෛත්‍රී භාවනා ක්‍රම. මේ වැරදි භාවනා ක්‍රම වලින් මිදිලා පහත දැක්වෙන පරම පවිත්‍ර වූ "අරිය මෛත්‍රී භාවනාව" වඩන්න පුරුදු විය යුතුයි.

- අරිය මෛත්‍රී භාවනාව

මමද සියලු ලෝක සියලු සත්වයෝ

සතර අපා දුකින් මිදී සෝවාන් ඵලයෙන් නිදුක් වෙත්වා!

කාමරාග පටිඝ ආදී රෝගයන්ට මුල්වන කෙලෙස් වලින් මිදී සකෘදාගාමී ඵලයෙන් නිරෝගී වෙත්වා!

ආමිස සුවයෙන් මිදී නිරාමිස සුවයට පත්ව අනාගාමී ඵලයෙන් සුවපත් වෙත්වා!

සදහටම සංසාර දුකින් මිදී නිදහස්ව අරහත් ඵලයෙන් දුකින් මිදෙත්වා!

පරම නිබ්බාන සුවයෙන් සුවපත් වෙත්වා!
පරම නිබ්බාන සුවයෙන් සුවපත් වෙත්වා!
පරම නිබ්බාන සුවයෙන් සුවපත් වෙත්වා!

❖ මෙසේ සියලු ලෝක සියලු සත්වයන් කෙරෙහි අරිය මෛත්‍රීය පැතිර වීමෙන් පසු පිරිසිදු සුදු චිත්ත කිරණ ශක්තියක් විශ්වයට පැතිරවිය හැකියි. ඒ සඳහා පහත සඳහන් කරන "සත්‍යය ක්‍රියාව" සිදු කළ යුතුයි.

- ස්ථිර වූ නික්ලේෂී වූ පරම පවිත්‍ර වූ පිරිසිදු වූ අවංක සිතින්ම, මෙම අධිෂ්ඨානමය සත්‍යය ක්‍රියාව කරමි.
- අනන්ත සංසාරයේ පටන් මේ මොහොත දක්වා මා විසින් රැස් කරගන්නා ලද සියලුම පුණ්‍ය සම්භාරයන් සියලු මිනිසුන්, දෙවියන්, බඹුන්, සියලු භූත ප්‍රේත තිරිසන් නිරය ආදී සතර අපාගත සත්වයන්, අසඤ්ඤ තලවල සිටිනා සත්වයන්ද ඇතුලු තල තිස් එක තුළම සිටින සියලුම සත්වයන් සිහිපත් කරමින් සමසේ පින් පතුරවා පින් පිහිටුවා පින් දෙමි. පින් කැපකොට පින් පවරමි. පින් අනුමෝදන් කරමි. පින් අනුමෝදන් වෙත්වා! පින් අත්පත් වෙත්වා!
- දැන් මාගේ සිත පිරිසිදුයි. අවංකවම පිරිසිදුයි. දැන් මාගේ සිත රාගයෙන් තොරයි. ද්වේශයෙන් තොරයි. මෝහයෙන් තොරයි. වීත රාගී, වීත ද්වේශී, වීත මෝහී සිතක් පවතින මේ මොහොතේ මාගේ සිතේ ඇතිවී තිබෙන යහපත් චිත්ත කිරණ ශක්තිය, පිරිසිදු සුදු චිත්ත කිරණ ශක්තිය දස දහසක් සක්වල වෙත පැතිරේවා! පැතිරේවා! පැතිරේවා!
- පිරිසිදු චේතනාවක් ඇතිව සියලුම මිනිසුන්, දෙවියන්, බඹුන්, භූත ප්‍රේත තිරිසන් නිරය ආදී සතර අපාගත සත්වයන් ඇතුලු තල තිස් එක තුළම සිටින සියලුම සත්වයන් වෙත පිරිසිදු චිත්ත කිරණ පතුරවමි. සියලුම සත්වයන්හට යහපතක්ම වේවා! සුවයක්ම වේවා! සැපතක්ම වේවා! සහනයක්ම වේවා!

- ආපෝ තේජෝ වායෝ පඨවි සතර මහා ධාතු භූත ශක්තිය පිරිසිදු වේවා! යහපත් වේවා! ආපෝ තේජෝ වායෝ පඨවි සතර මහා ධාතු භූත ශක්තියෙන් සෑදී ඇති විශ්වය පිරිසිදු වේවා! යහපත් වේවා!

- තල තිස් එක තුළම සිටින සියලුම සත්වයන්ගේ සිත් තුළ මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා යහපත් සිතුවිලි ඇති වේවා! රාගයෙන් තොර වේවා! ද්වේශයෙන් තොර වේවා! මෝහයෙන් තොර වේවා! අවිද්‍යාව දුරු වේවා! පිරිසිදුම වේවා!

- තල තිස් එක තුළම සිටින සියලුම සත්වයන්ට යහපතක්ම වේවා! සැපතක්ම වේවා! සහනයක්ම වේවා! සදහටම සංසාර දුකින් මිදී නිදහස්ව පරම නිබ්බාන සුවයෙන් සුවපත් වේවා!

❖ බුද්ධ දේශනාවට අනුකූලව බුදුන්වහන්සේ ප්‍රමුඛ මහා සංඝ රත්නයට දානමය පුණ්‍ය ක්‍රියා දහසක් සිදු කිරීමෙන් ලැබෙන ආනිසංස වලට වඩා මේ අරිය මෛත්‍රී භාවනාව මෙනෙහි කිරීමෙන් ලැබෙන ආනිසංස අපමණ වේ. එසේම ඉහත සඳහන් සත්‍යය ක්‍රියාව සිදු කරමින් විශ්වයට පිරිසිදු සුදු චිත්ත කිරණ ශක්තියක් පැතිරවීම ඊටත් වඩා ආනිසංස ලබා දේ. එසේම මෙසේ අරිය මෛත්‍රීය වැඩීම සහ සත්‍යය ක්‍රියාව සිදු කිරීම ලෝකෝත්තර බවට පත්වීමට මහෝපකාරී වේ. මෙසේ දිනපතා අරිය මෛත්‍රීය පැතිර වීමෙන් සහ ඉහත සඳහන් සත්‍යය ක්‍රියාව සිදු කිරීමෙන් අප විසින් කිළිටි කළ විශ්වය නැවතත් පිරිසිදුකර ණයෙන් මිදී නිදහස් වෙන්නටත්, අපේ හිතේ යම් පුද්ගලයෙක් හෝ සත්වයෙක් හෝ කෙරෙහි ඇති වූ යම් ද්වේශයක්, වෛරයක් නිසා සිදුකරගත් සංසාර ණය ගනුදෙනු වලින් මිදී නිදහස් වෙන්නටත් පුළුවන්කම තියෙනවා. මෙය “දෙවන පියවරයි”.

## තුන්වෙනි කරුණ - පින් අනුමෝදන් කිරීම

- මේ විශ්වය තුළ අපට උදව් උපකාර කළ, මග පෙන් වූ, පිහිට වූ, සහයෝගය දැක් වූ බොහෝ අය ඉන්න පුළුවන්. ස්වාමීන් වහන්සේලා, මව් දෙමව්පියන්, වැඩිහිටියන්, ගුරුවරුන්, අඹුදරුවන්, ඥාති හිත මිත්‍රාදීන්, සේව්‍ය සේවකයන්, අසල්වැසියන් මේ වගේ බොහෝ අය මෙන්ම හරකුන් බල්ලන් වැනි සතුන් පවා අප පැමිණි මේ සංසාර ගමනේදී කවදා කෙදිනකදී මොනයම් ආකාරයකින් හෝ අපට උදව් උපකාර කරන්නට ඇති. ඒ අනුව අපි ඒ අයට ණයයි. මේ ණය ගෙවා ඉවර නැති බැවින් නැවත නැවතත් අප ඒ අය වටාද, ඒ අය අප වටාද ණය ගෙවීම සඳහා ඉපදීමට සිදුවේ. එහෙත් අප ඒ බව නොදැන නැවත නැවතත් ඒ අයට ණය වේ. ඒ ණය වෙච්ච අයට ණය ගෙවා අවසන් වනතුරු තමන්ට නිවන් දැකගන්නට ණයෙන් මිදී නිදහස් වෙන්නට බැහැ.

- අද මිනිසෙකු හැටියට ඉපදිලා ඉන්න අපි හැම කෙනෙකුටම සිරිපාද කන්දටත් වඩා විශාල පින් කන්දක්, මේ ජීවිත කාලය තුළ හෝ පෙර ජීවිත කාලයන් තුළ සිදු කරගත් පුබ්බේත කත පුඤ්ඤතා ශක්තියක් උරුම වෙලා තියෙනවා. මේ පින් උපාදානය කරගෙන පුඤ්ඤාභි සංඛාර හැටියට පවත්වාගෙන ගියොත් අපේ නිවන ප්‍රමාද වෙනවා. ඒ නිසා මේ පින් කන්ද අපි හැම දවසකම පින් අවශ්‍යය අයට, පින් ගන්න පුළුවන් අයට, පින් ගන්න බැරි අයට, පින් ගත්තත් නැතත් අනන්ත සංසාරයේ අපට උදව් උපකාර කරලා ණය තියෙන සෑම දෙනාටම, පින් කරගන්නට නොහැකිව ඥාති ප්‍රේතයන් හැටියට ඉන්න අය ඇතුලු සියලු සත්වයන්ට සමසේ පින් දිය යුතුයි. පළමුව සියලු සත්වයන් සමග ඇති සංසාර ණය ගනුදෙනු වලින් තමන් මිදී නිදහස්වීම සඳහා කාටවත් අඩුපාඩුවක් නැතුව විශේෂයක් නැතුව සියලු දෙනාටම සමසේ පින් කැපකරලා පින් පවරලා පින් අනුමෝදන් කළ යුතුයි.

❖ දෙවනුව ඒ අය (පරදත්තූප ජීවීන් ආදී) මුදවා නිදහස් කිරීමට කටයුතු කළ යුතුයි. නිවන් මගට උපකාර වන ලෙස සියලු සත්වයන්ට පින් පතුරවා පින් අනුමෝදන්කර පිහිට විය යුතුයි.

❖ කෙනෙක් මියගිය විට එම ඥාතියා නමින් පළමුව පින්දීම නුසුදුසුයි. අපි කළයුතු වන්නේ පළමුව තම තමන් නමින් අතීත සංසාරයේදී මියගිය සියලු දෙනා සිහිපත්කර සමසේ පින් අනුමෝදන්කර පසුව ඒ මියගිය ඥාතියා හටත් පින් අනුමෝදන් කිරීමයි.

❖ ඒ අනුව අපිට පුළුවන් අපේ මේ පින් කන්ද සංසාර ණය ගෙවන්නට උපකාර කරගන්න. අප විසින් අරිය මෛත්‍රීය වැඩීමෙන් සහ සත්‍යය ක්‍රියාව සිදුකිරීමෙන් රැස් කරගත් පුණ්‍ය සම්භාරයන් මෙන්ම අතීත සංසාරයේ දී රැස් කරගත් සියලුම පුණ්‍ය සම්භාරයන් සියලු සත්වයන්ට සමසේ අනුමෝදන් කිරීමෙන් සංසාර ණය ගනුදෙනු වලින් මිදී නිදහස් විය හැකියි. අප විසින් පින් පැවරීම සිදුකරන ආකාරය වැරදි නම් කිසිවෙක් අපි දෙන පින් ලබා ගන්නේ නෑ. ඒ නිසා පින් දෙන අවස්ථාවේදී රාගයෙන් ද්වේශයෙන් මෝහයෙන් තොරවූ පිරිසිදු සිතක් පවත්වාගෙන එනම් තුන් සිත පහදාගෙන පිරිසිදු චේතනාවක් ඇතුව පහත ගාථා යථාවබෝධයෙන් යුතුව කියා නිවැරදිව පින් අනුමෝදන් කළ යුතුයි.

- එත්තාවතාව අම්හේහී සම්බදං පුණ්‍ය සම්පදං
  සබ්බේ දේවා අනුමෝදන්තු සබ්බ සම්පත්ති සිද්ධියා
  එත්තාවතාව අම්හේහී සම්බදං පුණ්‍ය සම්පදං
  සබ්බේ භූතා අනුමෝදන්තු සබ්බ සම්පත්ති සිද්ධියා
  එත්තාවතාව අම්හේහී සම්බදං පුණ්‍ය සම්පදං
  සබ්බේ සත්තා අනුමෝදන්තු සබ්බ සම්පත්ති සිද්ධියා
- ඉදං මේ ඥාතීනං හෝතු සුඛිතා හොන්තු ඥාතයෝ
  ඉදං මේ ඥාතීනං හෝතු සුඛිතා හොන්තු ඥාතයෝ
  ඉදං වෝ ඥාතීනං හෝතු සුඛිතා හොන්තු ඥාතයෝ

- අනන්ත සංසාරයේ පටන් මේ මොහොත දක්වා මා විසින් රැස් කරගන්නා ලද සියලුම පුණ්‍ය සම්භාරයන් සියලු දෙවියන් බඹුන්, සියලු භූත ප්‍රේත තිරිසන් නිරය ආදී සතර අපාගත සත්වයන්ද ඇතුලු තල තිස් එක තුළම සිටින සියලුම සත්වයන්ට සමසේ පින් පතුරවා පින් පිහිටුවා පින් දෙමි. පින් කැපකොට පින් පවරමි. පින් අනුමෝදන් කරමි. පින් අනුමෝදන් වෙත්වා! පින් අත්පත් වෙත්වා!

- අනන්ත සංසාරයේ පටන් මේ මොහොත දක්වා මා විසින් රැස් කරගන්නා ලද සියලුම පුණ්‍ය සම්භාරයන් මියගිය මට ඥාති සම්බන්ධකම් ඇති අයටත් (ඉදං <u>මේ</u> ඥාතීනං) වෙනත් අයට ඥාති සම්බන්ධකම් ඇති අයටත් (ඉදං <u>වෝ</u> ඥාතීනං) සමසේ පින් පතුරවා පින් පිහිටුවා පින් දෙමි. පින් කැපකොට පින් පවරමි. පින් අනුමෝදන් කරමි. පින් අනුමෝදන් වෙත්වා! පින් අත්පත් වෙත්වා!

- අනන්ත සංසාරයේ පටන් මේ මොහොත දක්වා මා විසින් රැස් කරගන්නා ලද සියලුම පුණ්‍ය සම්භාරයන් අනන්ත සංසාරයේ පටන් මේ මොහොත දක්වා මා පැමිණි මේ සංසාර ගමනේ දී මට මග පෙන්වූ ස්වාමීන්වහන්සේලාට මට උදව් කළ උපකාර කළ දෙමව්පියන්ට, වැඩිහිටියන්ට, ගුරුවරුන්ට, සහෝදර සහෝදරියන්ට, ස්වාමිපුරුෂයන්ට, භාර්යාවන්ට, දූ දරුවන්ට, ඥාති හිත මිත්‍රාදීන්ට, සේව්‍ය සේවකයන්ට, අසල්වැසියන්ට, ක්‍රියාවෙන් වචනයෙන් සිතින් සහයෝගය දැක්වූ පිහිටවූ සියලු ලෝක සියලු සත්වයන්ට, සමසේ පින් පතුරවා පින් පිහිටුවා පින් දෙමි. පින් කැපකොට පින් පවරමි. පින් අනුමෝදන් කරමි. පින් අනුමෝදන් වෙත්වා! පින් අත්පත් වෙත්වා!

- අනන්ත සංසාරයේ පටන් මේ මොහොත දක්වා මා විසින් රැස් කරගන්නා ලද සියලුම පුණ්‍ය සම්භාරයන් මා පැමිණි මේ සංසාර ගමනේ දී මා අතින් දැන හෝ නොදැන මරණයට පත් වූ, දුක් වේදනාවකට පත් වූ, සිත් රිදවීමකට ලක් වූ සියලු පුද්ගලයන්ට සහ සත්වයන්ට සමසේ පින් පතුරවා පින් පිහිටුවා පින් දෙමි. පින් කැපකොට පින් පවරමි. පින් අනුමෝදන් කරමි. පින් අනුමෝදන් වෙත්වා! පින් අත්පත් වෙත්වා!
- අනන්ත සංසාරයේ පටන් මේ මොහොත දක්වා මා විසින් රැස් කරගන්නා ලද සියලුම පුණ්‍ය සම්භාරයන් තල තිස් එක තුළම සිටින සියලුම සත්වයන් විසින් අනුමෝදන් කරගනිමින් ඔවුන් කෙරෙහි ඇති සියලු ආකාර වූ ණය ගනුදෙනු වලින් මාව මේ මොහොතේම මුදවත්වා!!! එසේම මට ණයගැති අයවද එම ණයගැති බවෙන්, මම මුදවා නිදහස් කරමි. නිදහස් වෙත්වා!!!
- තවද මේ අනුමෝදන් කළ සියලුම පුණ්‍ය ශක්තීන් සියලුම මිනිසුන්ට, දෙවියන්ට, බඹුන්ට, භූත ප්‍රේත තිරිසන් නිරය ආදී සතර අපාගත සත්වයන්ට, අසඤ්ඤ තලවල සිටිනා සත්වයන් ඇතුලු තල තිස් එක තුළම සිටින සියලුම සත්වයන්ට, චතුරාර්ය සත්‍යය ධර්මාවබෝධය ලැබ, සංසාර දුකින් සදහටම මිදී නිදහස්ව පරම නිබ්බාන සුවයෙන් සුවපත් වන්නට උදව් වේවා! උපකාර වේවා! උපනිශ්‍රය වේවා! හේතු වාසනා වේවා!

❖ ඒ අනුව අපේ හිත මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා කියන පිරිසිදු තත්වයට පත් වෙනවා. හිතේ පැහැදීමක්, පිරිසිදුවීමක් ඇතිවෙලා, කෙළෙස් උදුරා දමන්නට පහසු විදිහට හිත සකස් වෙනවා. මේ පුණ්‍ය ශක්තිය අනුමොදන්වීම නිසා ඒ අයටත් යහපතක් වෙනවා. අපේ පිරිසිදු සුදු චිත්ත කිරණ ශක්තිය මතුවෙනවා. කුසලස්ස උපසම්පදා වෙනවා. විනෙය්‍ය ලෝකේ අභිජ්ජා දෝමනස්සං වෙනවා. මෙය “තුන්වන පියවරයි”.

# හතරවෙනි කරුණ - නිවන් මග යාමට උපකාර කිරීම

❖ බුදුහාමුදුරුවෝ දේශනා කළ පරම පවිත්‍ර නිර්මල සිරි සද්ධර්මය තේරුම් ගන්න පුළුවන් විදිහට, මාර්ග චරියාව සම්පූර්ණ කරගන්න පුළුවන් විදිහට, භෞතික, කායික සහ ලෞකික වශයෙන් අප විසින් දෙව් මිනිසුන්ට යුතුකම් වගකීම් ඉටු කළ යුතුයි. අපේ හිතේ මිනිස් ගුණධර්ම මතුකරගෙන, සියලු සත්වයන් කෙරෙහි පරම මෙත්තාවෙන් යුතුව, අපට අද ලැබිලා තියෙන මේ ශක්තීන් හැකියාවන් අනුව අපේ ක්‍රියාව, වචනය, සිතුවිලි තුලින් සහ දේපල සම්පත් යොදා ගෙන “නිවන් දැක ගැනීමට උපකාර වන නිවැරදි ධර්ම මාර්ගයේ යන්න” සියලු සත්වයන්ට උපකාරී වන ලෙස විශේෂයෙන්ම ධම්ම දාන, වස්තු දාන, ආහාර දාන, වස්ත්‍ර දාන ආදියෙන් අනිවාර්යයෙන්ම මුළු ජීවිත කාලය තුළම සියලු සත්වයන්ට උදව් උපකාර කළ යුතුයි. මෙය “හතරවන පියවරයි”.

ඉහත සඳහන් කළ කරුණු හතර (කමාව ගැනීම/ අරිය මෛත්‍රීය පැතිරවීම සහ සත්‍යය ක්‍රියාව සිදුකිරීම/ පින් අනුමෝදන් කිරීම/ නිවන් දැක ගැනීමට උපකාර වන නිවැරදි ධර්ම මාර්ගයේ යන්න සියලු සත්වයන්ට උදව් උපකාර කිරීම) නිවැරදිව, දෛනිකව සතියක් පමණ කරන කොට, මේ සංසාර ගමනේ තමන් බැඳුණු බැමි වලින් “සියයට පනහකටත්” වඩා ප්‍රමාණයකින් මිදී නිදහස් වෙන්න පුළුවන් කියන එක තමන්ටම තේරේවි. මේ අනුව හිත වික්ෂෝප වෙන්නේ නෑ. කම්පනයට පත් වෙන්නේ නෑ. හිතේ තැන්පත් වීමක්, සහනයක්, ශක්තියක් තමන්ටම ලැබෙනවා. මේ ආකාරයට, සංසාර ණය ගනුදෙනු වලින් මිදී නිදහස් වීමට අනුගමනය කළයුතු මාර්ග චරියාව, ප්‍රතිපදාව, නිවැරදිව කරගෙන යන්න අවශ්‍ය, බුද්ධ ශක්තියත්, ධම්ම ශක්තියත් ලැබෙනවා. ඒ අනුව නිබ්බානගාමී මාර්ග චරියාව පූර්ණ වීමට මෙය මහෝපකාරී වෙනවා.

## පරම පවිත්‍ර සිරි සද්ධර්ම දේශනා පවත්වනු ලබන ස්ථාන

- පරම නිබ්බාන ධර්මායතනය, මීරිගම: සෑම පෝය දිනකම උදෑසන 7.30 සිට සවස 3.30 දක්වා.
- පරම නිබ්බාන ධර්මායතනය,මීරිගම: බුදුපියාණන් වහන්සේ විසින් අනුදැන වදාල සති භාවනාව යනු කුමක්ද? විශේෂ මාසික බුද්ධ භාවනා වැඩසටහනට සහභාගී වියහැක. අමතන්න: 0333330029/0711354144
- දිවයිනේ අනෙකුත් ප්‍රදේශවල පැවැත්වෙන ධර්ම දේශනා පිළිබඳ සියලු විස්තර දැනගැනීම සඳහා අමතන්න: 0727012240

## පූජ්‍ය මීවනපලානේ සිරි ධම්මාලංකාර හිමියන් විසින් රචිත ධර්ම පුස්තක

- නිවන් අවබෝධ කරගැනීමට උපකාර වන පරම පවිත්‍ර සිරි සද්ධර්මය
- බුද්ධ බල - බුද්ධ ශක්ති බුද්ධ ඤාණ විග්‍රහය
- විමුක්ති මාර්ගය පෙන්වා වදාල උතුම් බුද්ධ ධර්මය භක්තියෙන් අදහන බුද්ධාගමක් කරා පරිවර්තනය වුයේ කෙසේද?
- සම්මත සත්‍ය හා පරමාර්ථ සත්‍ය හෙවත් දැනුම හා දැක්ම
- ගෞතම බුදුන් වැඩසිටි දඹදිව හෙළයා හඳුනාගත යුත්තේ ඇයි?
- සමන අරණ විහරණ බුද්ධ භාවනා සත්දින විහරණපටිපදා
- බුද්ධ දේශනාවෙහි පෙන්වා වදාල භාවනාව යනු කුමක්ද?
- ආනන්තරික පාප කර්මයන් හා සංඝභේද සූත්‍රය

## පරම පවිත්‍ර සිරි සද්ධර්ම දේශනා ඇතුලත් වෙබ් අඩවි

- ධර්ම දේශනා (video): www.utube.sirisaddharmaya.net
- ධර්ම දේශනා (mp3): www.deshana.sirisaddharmaya.net
- ධර්ම දේශනා (ගුවන්විදුලි): www.guwana.sirisaddharmaya.net
- සජීවී ධර්ම දේශනා: www.sirisaddharmaya.net
- ධර්ම පුස්තක: www.panhinda.sirisaddharmaya.net
- දහම් ගැටළු: www.dahamgatalu.wordpress.com
  www.atuvawa.sirisaddharmaya.net
- මේ උතුම් හෙළබිමෙහි සත්‍යය හෙළිදරව්ව:
  www.helabima.sirisaddharmaya.net